ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2008/2009

පරිපාලන නීතිය - LWU 3311

කාලය පැය 03 යි.

---

දිනය - 2009 මාර්තු මස 28 දින වේලාව - පෙ.ව. 09.30- ප.ව. 12.30 දක්වා

---

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01. "පාලිතයන් සමඟ කටයුතු කිරීමේදී, පාලකයන් විසින් සිය කාර්යයන් ඉටු කළ යුතු ආකාරය හා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ යම් නිශ්චිත වටිනාකම් (හෝ උත්කෘෂ්ඩ තත්වයක්) ප්‍රවර්ධනය කිරීම පරිපාලන නීතියේ අරමුණු අතරින් එකක් ලෙස සැලකිය යුතුය යන මතය පරිපාලන නීතියේ සැලකිල්ලට බඳුන් වියයුතු යහපත් ආරම්භක ස්ථානයක් වේ."

Peter Lane & Leighton McDonald, Principles of Administrative Law at page 313

සිය රාජකාරි ඉටු කිරීමේදී පොදු අධිකාරීන්ගේ ක්‍රියාකලාපය පාලනය කරන පරිපාලන නීතියේ වැදගත් මූලධර්ම ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. මිනිස් වාසයට නුසුදුසුය යන පදනම යටතේ කොල්වින් මහතාගේ නිවස වසා දැමීමේ නියෝගයක් එම්-ලෑන්ඩ් හි නගර සභාව විසින් නිකුත් කරන ලදී. නගර සභා පනතේ දක්වන පරිදි ඉහත නියෝගයට විරුද්ධව අභියාචනයක් කොල්වින් විසින් පළාත් පාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව මණ්ඩලය විසින් එම අභියාචනය ඉවත දමන ලදී. නිවස වසා දැමීමේ නියෝගය නිකුත් කරන ලද නගර සභාවේ නිලධාරියා ඉදිරියේ පෙනී සිටීමට අවසර නොදීමෙන් හා නිවස සම්බන්ධව පරීක්ෂණ පැවැත්වූ නගර සභාවේ පරීක්ෂණ නිළධාරියාගේ මූලික පරීක්ෂණ වාර්තාව අධ්‍යයනය කිරීමට අවසර නොදීම මත නගර සභාව විසින් ලබාදුන් වසා දැමීමේ නියෝගය ස්වභාවික යුක්ති මූලධර්ම නොසලකා ලබාදුන් තීරණයක් බව තමා විසින් මණ්ඩලයේ අවධානයට යොමු කරන ලද බව කොල්වින් ඔබට දැනුම් දෙයි.

නගර සභාවේ සාමාජිකයන් විසි පස් දෙනා, නගර සභාවේ ලේකම් සහ පරීක්ෂණ නිලධාරියා යන අයට මණ්ඩලය ඉදිරියට පැමිණීමට සිතාසි නිකුත් කරන ලෙස තමා පළාත් පාලන මණ්ඩලයෙන් ඉල්ලා සිටි බව ද ඔහු දැනුම්

දෙයි. නගර සභාවේ සභාපති සහ ලේකම් වෙත සිතාසි නිකුත් කිරීමට හා හරස් ප්‍රශ්න ඇසීමට මණ්ඩලය විසින් අවසර ලබා දුන්නද, අනෙකුත් සාමාජිකයන් හා පරීක්ෂණ නිලධාරියා වෙත සිතාසි නිකුත් කිරීම හා හරස් ප්‍රශ්න ඇසීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. කොල්වින් තවදුරටත් ගෙන හැර දක්වා සිටින්නේ මණ්ඩලයේ එක් සාමාජිකයකු නගර සභාවේ සභාපතිගේ ළඟම ඥාතියෙකු වන නිසාම මණ්ඩලයේ තීරණයට සභාපතිගේ බලපෑමක් ඇති බවට සාධාරණ සැකයක් තම සිත්හි ඇති බවයි. අභියාචනයේදී තමා වෙනුවෙන් කරුණු කියාපෑමට නීතිඥවරයෙකු ඉල්ලා සිටියද, එම ඉල්ලීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ බව කොල්වින් දන්වා සිටී.

මණ්ඩලයේ තීරණය අභියෝගයට ලක් කිරීමට කොල්වින්ට අවශ්‍ය වේ. ඉහළ මට්ටමක සාර්ථක අභියෝගයක් ඉදිරිපත් කළ හැකි පදනම් දක්වමින් ඔහුට උපදෙස් දෙන්න. අදාළ නඩු තීරණ සාකච්ඡාවට ලක් කරමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

03. "අධිකරණ සමාලෝචනය යනු, තීන්දුව ලබාදුන් ආකාරය විමර්ශනය කිරීමක් මිස, තීන්දුවක් සම්බන්ධයෙන් වන අභියාචනයක් නොවන බව බොහෝ විට දක්වා ඇත."

*Chief Constable of North Wales Police v. Evans [1982] 3 All E R 141,155*

ඉහත ප්‍රකාශය අනුසාරයෙන්, පරිපාලන අභිමතය සම්බන්ධයෙන් පවතින්නාවූ අධිකරණමය පාලනයේ පදනම් සමඟ අන්‍යෝන්‍යව බැඳී පවතින්නා වූ අධිකරණ සමාලෝචනය සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පදනම, විනිශ්චිත නඩු තීන්දු අදාල කොට ගනිමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

04. ඇනිස්මිනික් නඩු තීන්දුව මගින්, ව්‍යවස්ථාව මතුපිට දෝෂය නම් සිද්ධාන්තය බලාතික්‍රමණ රීතිය තුළට ගෙන එන ලදී.

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද?
ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

05. සිනමා ශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ වන්නා වූ බලපත්‍ර නිකුත් කිරීමේ සහ ඒවා අවලංගු කිරීමේ බලතල X නගර සභාවේ සභාපති වෙත පවරා දී තිබුණි. බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන්නා වූ සුදුසු නියමයන් හා කොන්දේසි සකස් කිරීමේ බලයද ඔහුට පවරා තිබුණි. මීට මාස කිහිපයකට ඉහත දී ස්ටාර් ලයින් සිනමා ශාලාව වෙත බලපත්‍රයක් නිකුත් කරන ලදී. අදාළ සිනමා ශාලාව බාලිකා පාසලක් ආසන්නයේ පිහිටා ඇති බවත්, දිවා කාලයේදී චිත්‍රපටි නැරඹීමට පැමිණෙන මිනිසුන් නිසා පාසල පවත්වාගෙන යාමට බාධා සිදුවන බවත් අසල්වැසි ජනතාව දැන් චෝදනා කර සිටිති. ඔවුනු තවදුරටත් චෝදනා කර සිටිනුයේ, පෝය දිනවල හා රජයේ නිවාඩු දිනවල එම සිනමා ශාලාව විවෘතව තබන අතරම වැඩිහිටියන්ට පමණක් සීමා වූ චිත්‍රපට නැරඹීම සඳහා දරුවන්ට අවසර ලබා දීමද සිදු කරන බවයි. ජනතාව මේ පිළිබඳව සභාපති වෙත ලිඛිතව පැමිණිලි කර තිබුනද, මාස 4 කට අධික කාලයක් තිස්සේ කිසිදු පියවරක් මේ සම්බන්ධයෙන් ගෙන නොමැත.

මෙම තත්ත්වයට එරෙහිව, කුමන පදනම් මත, කවර ප්‍රතිකර්ම ලබාගත හැකිද යන්න සම්බන්ධව ජනතාව ඔබගෙන් උපදෙස් පතති.

ඔවුනට උපදෙස් දෙන්න.

06. "ප්‍රකාශනාත්මක තීන්දුව වුකලී බහුලව දක්නට ඇති නමුත්, පරිපාලන අධිකාරීන්ගේ ක්‍රියාවන්ට එරෙහිව වර්තමානයේ පවතින්නා වූ ප්‍රතිකර්මයන්ගෙන් වඩාත්ම වැදගත් ලෙස ප්‍රයෝජනවත් වන්නකි."

Fricdmann, Law in the Changing Society (19p)

ශ්‍රී ලංකාවේ පරිපාලනමය ක්‍රියාවන් පිළිබඳව ප්‍රකාශනාත්මක නියෝග නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින්නා වූ මතභේදාත්මක අධිකරණමය ගැටළු අනුසාරයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

07. ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනත (Land Redemption Ordinance) අනුව "කෘෂිකාර්මික ඉඩම්" අත්කර ගැනීමේ බලතල ඉඩම් කොමසාරිස් වෙත ලබා දී ඇත. පදිංචි නිවස , ළිඳ, පොල් ගස් 150 ක් හා කුඹුරු අක්කර 2 ක් සහිත ඩේවිඩ්සන්ගේ ඉඩම ද කොමසාරිස් විසින් අත්කර ගන්නා ලදී. ඩේවිඩ්සන් දක්වා සිටින්නේ, ආඥාපනතට අනුව කෘෂිකාර්මික ඉඩම් යන අර්ථ නිරූපණයට තම ඉඩම අයත් නොවන නිසා කොමසාරිස්ට ඉඩම අත්කර ගැනීමට බලය නොමැති බවයි. තවදුරටත් ඔහු කියා සිටින්නේ කොමසාරිස්ගේ පුතා සහ

ඩේවිඩ්සන්ගේ බෑණා අතර ව්‍යාපාර ගනුදෙනු සම්බන්ධයෙන් හිත් නොහොඳ තත්වයක් පවතින අතර එනිසාම මෙම ක්‍රියාව පුද්ගලික පලිගැනීමක් වන බවයි.

කොමසාරිස්ගේ තීරණය සාර්ථකව අභියෝගයට ලක් කළ හැකි පදනම් පිළිබඳව ඩේවිඩ්සන් ඔබගෙන් උපදෙස් අපේක්ෂා කරයි.

ඔහුට උපදෙස් දෙන්න.

08. "අභිනියෝජන ව්‍යවස්ථා සම්බන්ධයෙන් සම්මත තර්කයක් වන්නේ පාර්ලිමේන්තුවට විස්තරාත්මකව මැදිහත් වීමක් කළ නොහැකි අවස්ථාවලදී එය අවශ්‍ය වන බවයි. නමුත් හදිසි අවස්ථා බලතල සම්බන්ධයෙන් හැර අනෙකුත් සාමාන්‍ය තත්ත්වයන් යටතේ පාර්ලිමේන්තුව විසින් සමහර අවස්ථාවලදී නීති සෑදීමේ බලය අභිනියෝජනය කරයි."

H.W.R.Wade & C.F.Forsyth. Administrative Law 7th Edition P.862

අභිනියෝජන ව්‍යවස්ථාවන් සකස් කිරීම සඳහා සාධාරණ හේතු ඉදිරිපත් කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

හිමිකම් ඇවිරිණි.